## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය - 2016

-----------------------------------------------------------------

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනත සහ 1991 අංක 28 දරන සංශෝධිත පනතේ 24 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පරිපාලිත සමාගමේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් පත්කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය - සමූහය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### මතය - ආයතනය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

#### ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 01

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයෙහි මුළු ස්කන්ධයෙහි වෙනස්වීම දැක්වීම වෙනුවට රඳවාගත් ලාභයෙහි වෙනස්වීම පමණක් දක්වා තිබුණි.

(ආ) ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතන සමාගම විසින් රාජ්‍ය බැංකුවක් වෙත 2017 දෙසැම්බර් 20 දින ගෙවියයුතු රු.මිලියන 15 ක් වූ ණය වාරිකය ජංගම වගකීම් යටතේ දැක්වීම වෙනුවට ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව උපයන විට ගෙවීම් බදු හා ආර්ථික සේවා ගාස්තු රු.2,540,039 ක් හා ප්‍රමාද ගාස්තු රු.2,626,032 ක් ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණ ද ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව එවැනි ගෙවිය යුතු ශේෂයක් නිරීක්ෂණය නොවුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) 2012 ජුනි 22 දින වසා දමන ලද යාපනය ශාඛාව පවත්වාගෙන යනු ලැබූ ගොඩනැගිල්ල සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදලින් ඉතිරි රු. 30,124 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.**

**(ආ) ණයගැති කාලවිශ්ලේෂණයට අනුව 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2කට වඩා වැඩි කාලපරිච්ඡේදයක් තිස්සේ සිසුන්ගෙන් අයවිය යුතු පාඨමාලා ගාස්තු රු.409,405 ක් අයකර ගෙන නොතිබුණි.**

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------------------------**

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2014 අංක 02 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව සංශෝධන පනතේ 02 වගන්තිය | සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත පාලක සභාවේ එක් සාමාජිකයකු සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද පාලක සභා රැස්වීම් 12 ටම සහභාගි වී නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ කොන්ත්‍රාත් 04 කට අදාල වර්ෂ 05 ඉක්මවූ එකතුව රු.1,047,618 ක් වූ කොන්ත්‍රාත් රඳවා ගැනීමේ තැන්පතු නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2013 පෙබරවාරි 26 දිනැති අංක 1/2013 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ චක්‍රලේඛය | ආයතනවල පවත්වනු ලබන සියළුම වෘත්තීය පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ level) තත්ත්වය ලබාගත යුතු අතර ඒ සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතීතනය ලබාගත යුතු වේ. එහෙත් ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන කළමනාකරණ හා පරිගණක පාඨමාලා 09 ක් සඳහා 2015 ජූලි 07 දින සිට 2017 ජූලි 08 දින දක්වා ලියාපදිංචි කිරීම පමණක් සිදුකර තිබුණි.<br><br>සභාපති වරයාගේ පිළිතුරට අනුව පාඨමාලා 09 කට ජාතික වෘත්තීය සුදුසුකම (NVQ level) ලබා ගැනීම සඳහා 2016 ඔක්තෝබර් 14 දින තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට අයදුම්පත් භාර දී ඇතත් ඉන් අයදුම්පත් 02 කට පමණක් 2017 අගෝස්තු 22 දින ජාතික වෘත්තීය (NVQ Level) සුදුසුකම් තත්ත්වය ලබා දී තිබුණු බව සඳහන් කර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමූහය

-------

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 131,086,096 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 627,678,749 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.496,592,653 කින් පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේදී සමූහයේ ආදායම රු.68,023,915 කින් අඩුවී තිබුණු අතර සෘජු වියදම් රු.186,907,075 කින්ද මෙහෙයුම් හා වෙනත් වියදම් රු.177,809,872 කින් හා මූල්‍ය වියදම් රු.84,640,203 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ආයතනය

-----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 108,935,764 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 164,200,400 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.55,264,636 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ ලාභාංශ ආදායම රු.25,309,711 කින් වැඩිවී තිබුණද මෙහෙයුම් ආදායම රු.8,380,025 කින් අඩුවීම හා වැටුප් හා දීමනා රු.40,200,244 කින්ද, මෙහෙයුම් වියදම් රු.20,594,210 කින්ද වැඩිවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ආයතනයේ දායකත්වය

------------------------

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරිමේදී 2012 වර්ෂයේ රු. 217,785,460 ක් වූ ශුද්ධ ලාභය 2013 වර්ෂයේ පමණක් රු. 250,164,789 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර 2016 වර්ෂයේ රු. 108,935,764 දක්වා පිරිහී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිතෝෂික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සහ රජයට ගෙවූ බදු සැලකිල්ලට ගැනීමෙන් පසු ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා දායකත්වය පිළිවෙලින් රු. 434,322,775 ක්, රු. 484,985,199 ක්, රු. 483,742,056 ක්, රු. 518,947,843 ක් හා රු. 517,956,027 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

4.1 කාර්යසාධනය

-------------------

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව අධ්‍යාපනය හා අභ්‍යාසය සඳහා විධිවිධාන සැලැස්වීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම, කළමණාකාරිත්ව තොරතුරු සහ උපදේශන සේවා සැපයීම සහ නිෂ්පාදිතය වැඩිදියුණු කිරීම පහසු කරලීමද ප්‍රධාන වශයෙන් අරමුණු කර ගත් ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පාඨමාලා සඳහා සහභාගී වී තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව 732 කින් එනම් සියයට 7.0 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පවත්වා තිබූ පාඨමාලා සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 281 සිට 278 දක්වා අඩුවී තිබූ අතර සහභාගීවූ ශිෂ්‍ය සංඛ්‍යාවද 10,401 සිට 9,669 දක්වා අඩුවී තිබුණි. මහනුවර මධ්‍යස්ථානය හැර ප්‍රධාන කාර්යාලය ඇතුළුව අනෙකුත් මධ්‍යස්ථානයන්හි පාඨමාලා සඳහා සහභාගිවූ ශිෂ්‍ය සංඛ්‍යාව මෙලෙස අඩුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.8,380,085 කින් එනම් සියයට 1.2 කින් අඩු වී තිබුණද සෘජු වියදම් රු. 59,435,093 කින් එනම් සියයට 21 කින් වැඩි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

2013 ඔක්තෝබර් 17 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී නිදහස් ප්‍රදානයක් වශයෙන් ආයතනයට පවරා දීමට අනුමැතිය ලබාදී තිබුණු ප්‍රධාන කාර්යාලය හා කොළඹ අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටි ඉඩම හා 2007 නොවැම්බර් 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පවරා දීමට අනුමැතිය ලබා දී තිබූ හෙක්ටයාර් 0.345 ක් වූ ගාල්ල නගරයෙහි පවත්වාගෙන යනු ලබන අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටි ඉඩම සඳහා 2017 ජූනි 30 දින වන විටත් හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 27 හි 2.8.1 (අ) වගන්තිය අනුව ප්‍රසම්පාදන කමිටු සාමාජිකයෙකු එම කමිටුවේ සහ තාක්ෂණ ඇගයීම් කමිටුව යන කමිටු දෙකෙහිම සේවය නොකළ යුතු වුවද ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා 2017 වර්ෂයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස පත්කර සිටියදී ආයතනයේ ගොඩනැගිලි කුලියට ගැනීමේ කාර්යයට අදාල තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපති ලෙස ද කටයුතු කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලය 222 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 180 ක්, වූයෙන් එදිනට තනතුරු 42 ක් පුරප්පාඩුව පැවතුණි.මෙම පුරප්පාඩු තනතුරු අතර අංශ ප්‍රධානී තනතුරු 03 ක් හා ජ්‍යෙෂ්ඨ උපදේශක හා දේශකවරු 12 ක් පුරප්පාඩුව පැවතුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව ප්‍රසිද්ධ දැන්වීම් හෝ පුවත්පත් දැන්වීම් පළකර කාර්ය මණ්ඩලය බඳවාගත යුතු වුවත් එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂය තුළ සහකාර අධ්‍යක්ෂ මූල්‍ය සඳහා එක් නිලධාරියකුද, කාර්යාල කාර්ය සහායකයන් දෙදෙනෙකු හා කළමනාකරණ සහකාරවරු 07 දෙනෙකු ද වැඩසටහන් සම්බන්ධීකාරකවරයකු හා කළමනාකරණ අභ්‍යාසලාභියකු ද ඇතුළුව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 12 දෙනෙකු බඳවාගෙන තිබුණි. එම බඳවා ගැනීම් වලට අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව අදාල තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරියකු 2016 මැයි 16 දින වැඩසටහන් සම්බන්ධීකාරක තනතුර සඳහා බඳවා ගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කෙටුම්පත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2017 ජූලි 06 දින තෙක් ප්‍රමාද කර තිබුණි.

5.2 සංයුක්ත සැලැස්ම

---

2012- 2016 වර්ෂය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම පසුගිය වර්ෂ පහ තුළ යාවත්කාලීන කර නොතිබුණු අතර සැලැස්මේ ඇතුළත් පහත සඳහන් අරමුණු ද සාක්ෂාත් කරගෙන නොතිබුණි.

(අ) ශුද්ධ ලාභය පසු ගිය වසරට සාපේක්ෂව සියයට 20 කින් ඉහළ නංවා ගැනීම.
(ආ) වාර්ෂික ආදායම සියයට 10 කින් ඉහළ නංවා ගැනීම
(ඇ) උතුරු නැගෙනහිර පළාත්වල දුරස්ථ ඉගැනුම් මධ්‍යස්ථාන ඉදි කිරීම.

5.3 අයවැය ලේඛනමය පාලනය

---

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම, තත්‍ය වියදම සමඟ සැසඳීමේදී වියදම් අයිතම 18 ක සියයට 37 සිට සියයට 255 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | - පවරාගත් වත්කම් සඳහා හිමිකම් ඔප්පු ලබා නොගැනීම. |
| (ආ) | නිලධාරීන් බඳවා ගැනීම | - නිලධාරීන් බඳවාගැනීමේදී අනුමත බඳවා ගැනීමේ කාර්ය පරිපාටියට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | - ඇස්තමේන්තු ඉක්මවා වියදම් දැරීම. |